# තාක්ෂණවේදය සඳහා විද්‍යාව - 13 ශ්‍රේණිය

තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් තොරතුරු තාක්ෂණ සංරචකය සඳහා නිකුත් කරන ලද අමතර කියවීම් පොත හෝ වදන් සැකසුම් මෘදුකාංග පිළිබඳ වෙනත් මූලාශ්‍ර ඇසුරින් පිළිතුරු ලබාගන්න

(1) පැතුරුම්පත් මෘදුකාංගයක් යන්න හඳුන්වන්න

(2) පැතුරුම්පත් මෘදුකාංග භාවිතාවන අවස්ථා හඳුනාගන්න

(3) පැතුරුම්පත් මෘදුකාංග 3ක් නම් කර ඒවා නිර්මාණය කරන ලද ආයතන නම් කරන්න

(4) එම මෘදුකාංගවල පොදු පහසුකම් හඳුනාගන්න

(5) පැතුරුම්පත් මෘදුකාංග විවෘතකොට එහි අතුරු මුහුණත නිරීක්ෂණය කර පහත සඳහන් දෑ පිළිබඳව දල අවබෝධයක් ලබා ගන්න

- වැඩපත (Work sheet)
- තීරු (Columns)
- පේළි (Rows)
- කෝෂ (Cells)
- කෝෂ නම් කිරීම ( Naming the cells)
- කෝෂ පරාසය
- කෝෂ ලිපිනය

(6) පහත දැක්වෙන කෝෂ පරාසයන් වැඩපතක අඳුරු කර දක්වන්න

1. A5 : A10
2. C10 : G10
3. B12 : E 12
4. C10 : F10

(7) පැතුරුම්පතක් තුළට දත්ත ඇතුළත් කර හැකි ආකාර 4 නම් කරන්න

(8) පහත දැක්වෙන සූත්‍ර මගින් ලැබෙන අගයන් දී ඇති පැවරුම්පත භාවිතයෙන් සොයන්න

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 2 | 5 | 10 | 15 | 20 | 25 | 30 |
| 3 | 3 | 6 | 9 | 12 | 15 | 18 |
| 4 | 1 | 2 | 1 | 2 | 5 | 6 |
| 5 | 4 | 3 | 1 | 8 | 9 | 10 |

(i) =A2*C3 (ii) =B2+D3+F5 (iii) =A3*B2+E3

(iv) =A4+B3+A1 (v) D2*E1/(A2*B3) (vi) =(C2+E2)/2